## 193 යනවා ආයෙත් මම එනවා

යනවා ආයෙත් මම එනවා
සූදානම් කැරැ තැනක් මගේ
පියාගෙ සග රජ දහනේ
ගෙනැ යන්නට ඔබ කැඳවා
ආයෙත් මා එනවා

අසා මේ බස් ඔබගේ සමිඳේ
කාට හැකිදැ ඉන්නට ඉවසා
මේ හැටි අප ගැනැ හිතා හිතා
මහ පුදුමේ ඔබ ඉන්න නියා

ඔබ එන තෙක් අප තනි කැරැලා
යන්නට හිතුවේ නැ සමිඳේ
සැනසිලි දායක සුදතුන් දැ
අපට උදව් කරු ලෙසැ එව්වේ

දවස පැයත් ඔබ නැ කීවේ
සැරැසී සිටිනට හැම මොහොතේ
ඇයි අප සිත් මේ පැකිළෙන්නේ
අදහමු සමිඳුන්ගේ වචනේ

ඉක්මන් කැරැ එමි ඔබ කියනෝ
වඩිනු මැනව සමිඳේ සමිඳේ
යන්නට ගමන'ප අවසානේ
මොහොතද දැන් දැන් ළගැ එන්නේ